**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2017**
**----------------------------------------------**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2020 ජූලි 24 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 අහිතකර මතය සඳහා පදනම**

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේනම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

**2. මූල්‍ය ප්‍රකාශන**

-------------

**2.1 අහිතකර මතය**

---------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

----------------------------------------------------------

**(අ) ශ්‍රී. ලං. ගි. ප්‍ර. 01 :- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------------------------------

ප්‍රමිතය ප්‍රකාරව, ශ්‍රි.ලං.ගි.ප්‍ර 08 හි දැක්වෙන පරිදි අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීමට අනුව වන බලපෑම හඳුනාගැනීමට අදාල වන ස්කන්ධයේ සෑම සංරචකයක්ම දක්වමින් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂ වලට අදාලව සිදු කරන ලද ගැලපීම් වල ශුද්ධ වෙනස පමණක් ගැලපීම් කර ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ශ්‍රී. ලං. ගි. ප්‍ර. 16 :- දේපල පිරියත හා උපකරණ**

----------------------------------------------------------

(i) වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2017 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු. 10,097,481 ක් වූ යන්ත්‍රෝපකරණ , මෝටර් රථ, කාර්යාල උපකරණ, ලීබඩු හා සවිකිරීම්, පුස්තකාල පොත්, ගිණුම් මෘදුකාංග සහ පරිගණක හා පරිගණක උපාංග වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර නොතිබුණි.

(ii) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් භාවිතයට ගනු ලබන මෝටර් රථ 01ක්, කාර්යාල උපකරණ 24 ක් සහ පරිගණක සහ උපාංග 49 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) (i) එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අධිකාරියට ලබා දුන් රු. 46,450,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.46,432,687 ක් වැයකර සමාලෝචිත වර්ෂය තුළදී මාකඳුර කර්මාන්ත පුරයේ පෙරවැඩුම් හා තාක්ෂණික භුවමාරු මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. එම මධ්‍යස්ථානය සීමා සහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කර තිබුණු අතර සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 60 ක දායකත්වයක් අධිකාරිය වෙත හිමි වී තිබුණි. ඉහත ප්‍රතිපාදනයෙන් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු.46,432,687 ක මුදල අධිකාරිය විසින් ඉහත සඳහන් සමාගමෙහි කරන ලද ආයෝජනයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, එම වටිනාකමට සමාන කොටස් ප්‍රමාණයක් සමාගම විසින් අධිකාරිය වෙත නිකුත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඉහත සඳහන් පරිපාලිත සමාගමේ තොරතුරු ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් ඉහත සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) පෙර වර්ෂවලට අදාලව පියවන ලද අත්තිකාරම් වටිනාකම වූ රු.19,633,940 ක් වැඩ සටහන් සඳහා වූ ප්‍රදාන ගිණුමට ගැලපීම වෙනුවට සමුච්චිත අතිරික්තයට ගැලපීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද වැඩ සටහන් සඳහා වූ ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු වටිනාකම රු.92,620 ක් වුව ද, එය රු.63,916 ක් වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වියදම රු.28,704 ක් වැඩියෙන්ද ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පරිගණක හා උපාංගවල ක්ෂය වටිනාකම රු.445,042 ක් වුව ද, එය රු. 290,823 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.154, 219 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) කුලී ගෙඩනැගිල්ලක පවත්වාගෙන යනු ලැබූ අධිකාරියේ කාර්යාල පරිශ්‍රයේ සිදුකරන ලද නඩත්තු හා අළුත්වැඩියාවන් සඳහා 2014 වර්ෂයේ හා 2016 වර්ෂයේ දරන ලද පිළිවෙලින් රු.1,280,282 ක් හා රු. 56,250 ක් වූ වියදම නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත නොකර යන්ත්‍ර සූත්‍ර ලෙස ප්‍රාග්ධනිත කර තිබුණු අතර ඊට අදාලව රු 590,892 ක් ක්ෂය වෙන් කර තිබුණි එම නිසා වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල ධාරණ අගය රු. 745,640 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ විගණනය මගින් පිළියෙල කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | අධිකාරිය විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව | විගණනය මගින් පිළියෙල කල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 28,288,562 | (112,503,769) | (140,792,331) |
| අයෝජන ක්‍රියාකාරකම් | (47,615,766) | (29,228,098) | 18,387,668 |
| මූල්‍ය ක්‍රියාකාරකම් | 3,136,805 | 125,541,469 | 122,404,664 |

(ii) වර්ෂය සඳහා වූ ගැලපීම් රු. 19,633,940 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අතිරික්තයට ගලපා නොතිබුණි.

(iii) වෙනත් ආදායම් තුළ ඇතුළත් විලම්භීත බැරකම් රු. 28,045,019 ක් මෙහෙයුම් අතිරික්තයට ගලපා නොතිබුණි.

(iv) වැඩසටහන් සඳහා ලද මූල්‍යාමය ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබුණි.

(v) කොන්ත්‍රාත් සඳහා වන වගකීම අඩුවීම රු. 4,326,007ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.15,921,026 ක් ලෙස සටහන්කර තිබුණි..

(vi) සී/ස බී - එක්ස්ප්‍රස් සමාගමේ සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ ආයෝජන සහ පෙර වර්ෂයේ සිදුකළ ආයෝජන අතර වෙනස රු.28,045,019 ක් වුව ද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.46,432,687 ක් ලෙස දක්වා තිබුණි.

(vii) සමාලෝචිත වර්ෂය තුළ ලද මුළු ප්‍රදාන වටිනාකම රු. 163,173,110 ක් වන ප්‍රදාන උපයෝජනය කිරීම රු.37,631,641 වුව ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාකම් යටතේ රජයේ ප්‍රදාන ලැබීම් වශයෙන් රු.3,136,805 ක් පමණක් සටහන් කර තිබුණි.

### 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශයන් මුදල් පොතේ ශේෂය සමග සැසැදී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 27,372,346 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,004,593ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,367,753 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලද ප්‍රදානයෙන් ආදායමට ලියා හල අගය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 9,657,351 කින් වැඩිවීම ඉහත අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2020 දෙසැම්බර් 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

### 3.3 ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.